# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 1994/43 – 2016 නොවැම්බර් 23 වැනි බදාදා – 2016.11.23**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

38 වැනි වගන්තිය (අ) යටතේ ආඥාව

**2016 අංක 283 දරන ආඥාව**

මගේ යොමු අංකය: 4-3/8/2012/PC/303.
ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය: KDS/YNU/4/LD/A/707.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 38 (අ) වැනි වගන්තිය යටතේ ආඥාවෙන් මා වෙත පවරා ඇති බලතල අනුව ඉඩම් අමාත්‍ය ජෝන් ඇන්තනී එම්මානුවෙල් අමරතුංග වන මම පහත සඳහන් උපලේඛනයේ 1 වැනි ජේදයේ සඳහන් ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියාට නැතහොත්, එකී නිලධාරියා විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියෙකුට, එම උපලේඛනයේ 2 වැනි ජේදයේ දැක්වෙන නියමිත ඉඩම භුක්තියට ගැනීමට මෙයින් නියම කරමි.

ජෝන් ඒ. ඊ. අමරතුංග,
ඉඩම් අමාත්‍ය.

2016 නොවැම්බර් මස 11 වැනි දින,
ඉඩම් අමාත්‍යාංශය,
'මිහිකත මැදුර', අංක 1200/6,
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

උපලේඛනය

1. **ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියා.**– ප්‍රාදේශීය ලේකම්, යටිනුවර.

2. **ඉඩමේ විස්තරය.**– මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, යටිනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ගඟපළාත කෝරළේ සුළු කොට්ඨාසයේ, කැන්දකඩුව - 134 ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, උඩර්ගම ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද මූලික පිඹුරු අංක මහ 6347 හා 2014.05.10 දිනැති පිඹුරේ පහත සඳහන් ඉඩම් කොටස්වලට මායිම්:

01. **කැබලි අංක 1 – කොටකාඹේවත්ත – ප්‍රමාණය: හෙක්. 0.0504**
උතුරට: ජේ. බී රත්නායක හිමිකම් කියන කොටකාඹේවත්ත සහ මු. පි.මහ 354 හි කැබලි අංක 1; නැගෙනහිරට: මු.පි.මහ 354 හි කැබලි අංක 1, කැබලි අංක 2 සහ ඊ. එම්. යූ. අනුර ගුණරත්න හිමිකම් කියන කොටකාඹේවත්ත; දකුණට: ඊ. එම්. යූ. අනුර ගුණරත්න හිමිකම් කියන කොටකාඹේවත්ත සහ ඒ. එම්. සෙනවිරත්න හිමිකම් කියන කොටකාඹේවත්ත; බටහිරට: ඒ. එම්. සෙනවිරත්න හිමිකම් කියන කොටකාඹේවත්ත සහ ජේ. බී. රත්නායක හිමිකම් කියන කොටකාඹේවත්ත.

12 - 375

## ශුද්ධි පත්‍රිකාව

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ ආඥාව

**1995 අංක 63 දරන ආඥාව**

අංක 879/15 හා 1995.07.15 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට්* පත්‍රයේ පළ කරන ලද 1995 අංක 63 දරන ආඥාවට අදාළ උපලේඛනයේ කැබලි අංක 09 හි ප්‍රමාණය හෙක්. 0.0073 ලෙසත් කැබලි අංක 40 හි ප්‍රමාණය හෙක්. 0.0027 ලෙසත් සංශෝධනය විය යුතු බව මෙයින් ප්‍රකාශ කරමි.

ජෝන් ඒ. ඊ. අමරතුංග,
ඉඩම් අමාත්‍ය.

මගේ අංකය: L/03/J/92/HW/281(1).
2016 නොවැම්බර් මස 17 වැනි දින,
ඉඩම් අමාත්‍යාංශය,
'මිහිකත මැදුර',
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

12 - 376

## ශුද්ධි පත්‍රිකාව

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

39 අ (1) වැනි වගන්තිය යටතේ ආඥාව අවලංගු කිරීම

අංක 1980/27 හා 2016.08.16 දිනැතිව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට්* පත්‍රයේ පළ කරන ලද ඉහත සඳහන් දැන්වීමෙහි ''39 අ (1) වැනි වගන්තිය යටතේ ආඥාව අවලංගු කිරීම'' යන්න ''39 අ (1) වැනි වගන්තිය යටතේ නියමය''ලෙස සංශෝධනය විය යුතු බව මෙයින් ප්‍රකාශ කරමි.

ජෝන් ඒ. ඊ. අමරතුංග,
ඉඩම් අමාත්‍ය.

මගේ අංකය: එල්ඩී/05/2001/යූඩීඒ/222.
ප්‍රාදේශීය ලේකම්ගේ අංකය: අත්/කේඑල්/44/යූඩී.
2016 නොවැම්බර් මස 11 වැනි දින,
ඉඩම් අමාත්‍යාංශය,
'මිහිකත මැදුර',
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

12 - 377

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.